**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය - 2019**
**---------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවටසාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේඅඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවල වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීවගලපා සංසන්දනාත්මක අගයන් ප්‍රතිෂ්ඨාපනය කර, එම වැරදිවල ස්වභාවය හා ගලපන ලද ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණු රු. 8,012,320 ක වැරදි නිවැරදි කිරීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වැරදි නිවැරදි කිරීම් කර නැවත ප්‍රතිෂ්ඨාපනය කර තිබුණද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මණ්ඩලය විසින් භාණ්ඩාගාර ප්‍රදාන මගින් මිලට ගත් වත්කම් සඳහා2015 සිට 2018 කාලපරිච්ඡේද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනසිට ක්‍රමක්ෂය ගැලපීම් කර තිබුණි. එසේ වුවත් එහිදී 2015 සිට 2018 දක්වා කාලයට අදාළව සිදුකර | 2015 වර්ෂයේ සිට 2018 වසර දක්වා ක්‍රමක්ෂය ගැලපීම් කර තිබුණි. නමුත් 2015 සහ 2018වර්ෂයන්ට අදාළ ක්‍රමක්ෂයරු. 5,043,761 සහ 2019 වර්ෂයට අදාළව ක්‍රමක්ෂයරු. 798,157 ක් අඩුවෙන් ගිණුම්ගත කර | ක්‍රමක්ෂය ගැලපීම ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව නිසි පරිදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු ක්‍රමක්ෂය ගැලපීම් රු.5,043,761 ක් අඩුවෙන්ද, 2019 වර්ෂයට අදාළ ක්‍රමක්ෂය රු.798,157 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඇති බව පිළිගන්නා අතර 2020 වසරේ ගිණුම් සැකසීමේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | |
| (ඇ) | 2004 සිට 2019 දක්වා නාරාහේන්පිට පිහිටි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා කොළඹ මහ නගර සභාවට ගෙවිය යුතු වූ වරිපනම් බදු රු. 2,384,989 වගකීම ගිණුම් වල ගලපා මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2019 වර්ෂයේදී මෙකී වරිපනම් ගෙවීමට අප වෙත මුල්වරට දැනුම් දීමට කටයුතු කර තිබුණු අතර ඊට පෙර හිඟ මුදල් සම්බන්ධව අප දැනුවත් වී නොතිබුණු බව දන්වමි. 2019 වර්ෂය වන විට නාගරික සංවර්ධන අධිකාරියමෙම ඉඩම අත්පත් කර ගත් බව දැනගන්නා ලදි. මේ වන විට මෙම ආයතනය තුළ තවත් ආයතන ක්‍රියාත්මකව තිබූ බැවින් ඒ ඒ ආයතන වලට වරිපනම් බෙදා දීමට කටයුතු කරන ලෙස දන්වන ලදි. 2020 වර්ෂයට අදාළව වරිපනම් මේ වන විට ගෙවා ඇත. 2019 හිඟ වරිපනම් සඳහා මෙම වසරේ ප්‍රතිපාදන ලබා ගැනීමෙන් පසු ගෙවීමට කටයුතු කරමි. | වරිපනම් හා අනෙකුත් වගකීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පතුවක් සඳහා 2018 වර්ෂයට අදාළව ලැබී තිබුණු රු. 331,907 ක පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායමක් ලෙස දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ආයෝජන ආදායමරු.774,855 ක් අඩුවෙන්මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2019 වර්ෂයේ ලාභය රු. මිලියන 70.4 කි. ඒ අනුව රු. 331,907 ක මුදල ලාභය අනුව ප්‍රමාණාත්මක නොවන බැවින් 2019 වර්ෂයේ ලාභයට ගැලපීමට කටයුතු කරන ලදි. කල්පිරුණු ස්ථාවර තැන්පත් නැවත ආපසු ලබාගතහොත් බැංකුව මඟින් ලබා දෙනු ලබන්නේ එකී කාලයට අදාලව සාමාන්‍ය ඉතිරි පොලි අනුපාතය වේ. ඒ අනුව සියයට 4ක ඉතුරුම් පොලි අනුව ගිණුම්ගත කර ඇත. කල්පිරුණු තැන්පතු සඳහා ස්ථාවර තැන්පතු පොලි ප්‍රතිශතයම ගණනය කර ඇත. | ආදායම උපචිත පදනම මත අදාළ වර්ෂයට අනුව ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 104 | සමාලෝචිත වර්ෂයේදී නාරහේන්පිට ප්‍රධාන කාර්යාලයේ සිදු වූරු. 48,990 ක් වටිනාකමැති ජංගම දුරකථනයක් අස්ථානගත වීම, 2012 වර්ෂයේදී නාරහේන්පිට පැළ තවානේ සිදු වූ රු. 77,362 ක මුදල් වංචා සහ 2018 වර්ෂයේ අනුරාධපුර උපුල්දෙණිය ගබඩාවේ සිදු වූ රු. 4,094,596 ක වටිනාකමැති සෝයා බෝංචිකිලෝ ග්‍රෑම් 37,223 ක් අස්ථානගත වීම සම්බන්ධ පරීක්ෂණ සිදු කර නොතිබුණි. | ජංගම දුරකථනය අස්ථානගත වීම නිසා සිදු වූ අලාභය සම්බන්ධව මු රෙ.104 පරීක්ෂණයක් සිදුකිරීමට කමිටුවක් පත්කොට ඇත. 2012වර්ෂයේ දී නාරාහේන්පිට පැළතවානේ සිදු වූ රු. 77,364 ක මුදල් සොරකම සම්බන්ධ පරීක්ෂණ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කොට ඇති අතර එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදෙන ලදි. ඒ අනුව ඉදිරි කටයුතු මේ වන විටත් සිදු කරමින් සිටියි. 2018 වර්ෂයේ සෝයා බෝංචි තොග අඩුව සම්බන්ධ මු.රෙ. 104 පරීක්ෂණ කෘෂිකර්ම අමාත්‍යාංශ විමර්ශන නිලධාරීන් විසින් තව දුරටත් සිදු කරමින් සිටියි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අප්‍රමාදව පරීක්ෂණ සිදු කළ යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.1.2 වගන්තිය | වැඩබැලීමේ පත්වීමක් සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව අදාළ තනතුරට සෑම අතින්ම සුදුසුකම් ඇති නිලධාරියෙකු පත්කළ යුතු වුවද සුදුසුකම් නොමැති ව්‍යාපෘති සහකාර III ශ්‍රේණියේ නිලධාරියෙකුට 2011 මැයි 02 දින වැඩබලන සහකාර අධ්‍යක්ෂ ලෙස පත්කර ඒ වෙනුවෙන් මාස 15 ක් සඳහා රු. 96,150 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවා තිබුණි. | මෙසේ වැඩබැලීමේ පත්වීමකට ඔහු පත් කිරීමට හේතු වුයේ 2011වර්ෂයේ දී සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරේ සේවය කළනිලධාරියා සේවය අතහැර යාම නිසා ඇති වූ පුරප්පාඩුව මතය. ආයතනයේ සංවර්ධන අංශයේ රාජකාරි කටයුතු අනුව ආයතනයේ පත්වීම් නිලධාරියා විසින් ලබා දුන් තීන්දුවක් මතය.ඒ වෙනුවෙන් වැඩබැලීමේ දීමනාවක් ලබා දී තිබුණු බව පිළිගනිමි. | මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටියේ විධිවිධානවලට අනුකූළව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ඇ) වගන්තිය | ගිවිසගත් සැපයුම් වටිනාකමින් සියයට 10 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් භාණ්ඩ සැපයුම්කරුවෙකුගෙන් ලබාගත යුතු වුවත්රු. මිලියන 1,506 ක් වටිනා බඩඉරිඟු ආනයනය කළ පුද්ගලික සමාගමකින් ලබාගත යුතුව තිබුණු රු. මිලියන 150.6 කට නොඅඩු සුරක්ෂණය වෙනුවටරු. මිලියන 5 ක සුරක්ෂණයක් පමණක් ලබාගෙන තිබුණි. එම කාර්යය සඳහාම රු. මිලියන 618.7 ක වටිනාකමකට සහ රු. මිලියන 500.6ක වටිනාකමකට ගිවිසුම් අත්සන් කර තිබුණු තවත් පුද්ගලික සමාගම් 2 කින් කිසිදු සුරක්ෂණයක් ලබා නොගෙන කොන්ත්‍රාත් පවරා තිබුණි. එසේ වුවත්එම සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව රු. මිලියන 5 බැගින් කාර්යසාධන සුරක්ෂණයන් අඩුකර තිබුණි. | බඩ ඉරිඟු ආනයන ක්‍රියාවලිය හා එමඟින් ඇති වූ දූෂණ ක්‍රියාවලිය පිළිබඳ පුළුල් වූ පරීක්ෂණයක් ලබා ගැනීම යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් යොමු කළ විගණන විමසුමේ නිරීක්ෂණ වල දක්වා ඇති පරිදි සහ රජයේ විගණන අංශයපෙන්වා ඇතිපරිදි බඩ ඉරිඟු ආනයනය කිරීමේදී අක්‍රමිකතාවයන් සිදු වී ඇති බව සඳහන් කර ඇති බැවින් ඒ සඳහා විමර්ෂණයක් පැවැත්වීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් සිදු කර ඇත . එයින් ලැබෙන වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේවිධිවිධාන කඩකිරීම සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදනමාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 සංශෝධිත වගන්තිය | රු. මිලියන 2,690 වටිනාකම් වූ බඩ ඉරිඟු ආනයනය කිරීමේ ප්‍රසම්පාදන කටයුත්ත සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගත යුතු වුවත්, මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුවවිසින් එය අනුමත කර තිබුණි. එහිදී කමිටු සාමාජිකයන් තිදෙනා අතරින් එක් අයෙකු ප්‍රසම්පාදන තීරණයට අත්සන් තබාද නොතිබුණි. | බඩ ඉරිඟු ආනයන ක්‍රියාවලිය හා එමඟින් ඇති වූ දූෂණ ක්‍රියාවලිය පිළිබඳ පුළුල් වූ පරීක්ෂණයක් ලබා ගැනීම යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් යොමු කළ විගණන විමසුමේ නිරීක්ෂණ වල දක්වා ඇති පරිදි සහ රජයේ විගණන අංශයපෙන්වා ඇතිපරිදි බඩ ඉරිඟු ආනයනය කිරීමේදී අක්‍රමිකතාවයන් සිදු වී ඇති බව සඳහන් කර ඇති බැවින් ඒ සඳහා විමර්ෂණයක් පැවැත්වීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් සිදු කර ඇත . එයින් ලැබෙන වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන කඩකිරීම සම්බන්ධව නොපමාව සුදුසු පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 70,409,680 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. 41,940,044 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 28,469,636 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන රු. 20,952,420 කින් වැඩිවීම වෙනත් ව්‍යාපෘති ආදායමරු. 10,625,568 කින් වැඩිවීම පොලී ආදායම රු. 8,057,890 කින් වැඩිවීම, ස්ථාවර වත්කම් නඩත්තු හා අලුත්වැඩියා වියදම්රු. 524,412 කින් අඩු වී ඇති නමුත් ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා සහ වෙනත් සේවා වියදම්රු. 11,703,247 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයකෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 සහ 2018 වර්ෂවලදී 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට විකිණීමේ කටයුතු සිදු කර තිබුණි.පස් ඉවත් කිරීම වෙනුවෙන් රු. 3,370,595 ක වියදමක් දරා තිබුණු අතර අධිවේගී මාර්ගවලට පස් විකිණීමෙන් රු. 81,134,631 ක ආදායමක් ලබා තිබුණි.වැව් ව්‍යාපෘති වාර්තාවට අනුවසපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින්මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමග යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර රු. 77,764,036 ක් ස්ථාවර තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | මණ්ඩලයේ පනතට අනුව කටයුතු කිරීම සහ රැස්කළ මුදල් අදාළ කාර්යයට යෙදවීමට පියවර ගත යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බඩඉරිඟු ආනයනය කිරීමේදී එහි ප්‍රමිතිය මණ්ඩලය විසින් පරීක්ෂා කර අනුමත කිරීමට කටයුතු නොකිරීම නිසා එක් බඩඉරිඟු ආනයනකරුවෙකු විසින් නියමිත පිරිවිතරවලට අනුකූල නොවන මෙට්‍රික් ටොන් 13,000 ක ප්‍රමාණයක් ආනයනය කර සත්ත්ව ආහාර නිෂ්පාදකයින් හට බෙදා හැර තිබුණි. එසේම මේ මගින් සත්ව ආහාරවලට වන බලපෑම පිළිබඳ ඇගයීමක්ද සිදුකර නොතිබුණි. | බඩ ඉරිඟු ආනයන ක්‍රියාවලිය හා එමගින් ඇති වූදූෂණ ක්‍රියාවලිය පිළිබඳ පුළුල් වූ පරීක්ෂණයක් ලබා ගැනීම යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් යොමු කළ විගණන විමසුමේ නිරීක්ෂණ වල දක්වා ඇති පරිදි සහ රජයේ විගණන අංශයපෙන්වා ඇතිපරිදි බඩ ඉරිඟු ආනයනය කිරීමේදී අක්‍රමිකතාවයන් සිදු වී ඇති බව සඳහන් කර ඇති බැවින් ඒ සඳහා විමර්ශනයක් පැවැත්වීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් සිදු කර ඇත. එයින් ලැබෙන වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | පරීක්ෂණ කටයුතු කඩිනමින් නිමකර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | මණ්ඩලය ලබාදුන් තොරතුරුවලට අනුව දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේදී විදේශවලින් ආනයනය කර තිබුණු බඩඉරිඟු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 49,554 ක් බව දක්වා තිබුණද මෙකී ආනයනයන් සම්බන්ධව රේගුවෙන් ලබාගත් තොරතුරුවලට අනුව ආනයනය කර තිබුණු තථ්‍ය බඩඉරිඟු මෙට්රික් ටොන් ප්‍රමාණය 37,186 ක් විය. මේ අනුව වෙනස වූ මෙට්රික් ටොන් 12,368 ක ප්‍රමාණය දේශීය ගොවීන්ගෙන් අඩු මිලට ලබාගෙන ගබඩාකර තබාගත් තොගවලින් ප්‍රතිපූර්ණය කර තිබුණු බව නිරීක්ෂණය වන අතර මෙමගින් බඩඉරිඟු ආනයනය කළ ආයතන තොග සඟවා තබා ගැනීම තුලින් අවම මිල ගණන් යටතේ වුවද රු. මිලියන 55 ක පමණ අයුතු ලාභයක් උපයා ඇති බවට වන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය. එසේ වුවත්, මෙම කටයුතුවලට මැදිහත් වීමට මණ්ඩලයට අමාත්‍ය මණ්ඩලය විසින් බලය පවර තිබුණද, මණ්ඩලය මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම | එම |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මගින් ව්‍යාපෘති 11 ක් සඳහා රු. මිලියන 145 ක් වෙන්කර තිබුණු අතර ඉන් සියයට 45 ක් උපයෝජනය කර තිබුණි. මෙම ව්‍යාපෘති 11 න්, මේ දක්වා මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරගෙන ආ ව්‍යාපෘති 03 ක් එනම් පර්යේෂණ සිදුකර නවෝත්පාදන ලෙස හඳුනාගත් සෝයා ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය, ඌෂ්ණ භාවිත පලතුරු බීම නිෂ්පාදන ව්‍යාපෘතිය සහ මණ්ඩලයේ සුවිශේෂී නිෂ්පාදනයන් වූ සුවපෝෂ හා මව්පෝෂ නිෂ්පාදනය හා තෝසේ පිටි නිෂ්පාදන කටයුතුමණ්ඩලය විසින් වෙළඳපොළ අවස්ථා උකහාගෙන නිෂ්පාදන ධාරිතාව හා සම්පත් යොදාගනිමින් නිෂ්පාදනය සිදුකර ලාභ උපයාගැනීමට කටයුතු සිදු නොකර පෞද්ගලික ව්‍යාපාරික සමාගම් සමඟ ගිවිසුම්ගතව නිෂ්පාදනය, බෙදාහැරීම හා ප්‍රවර්ධන කටයුතු කිරීමට තීරණය කර තිබුණි.ක්‍රියාකාරී සැලැස්ම මගින්තණමල්විල ගොවිපලේහිවියළි ගොමහා කොහුබත් මෙට්‍රික් ටොන් 75 බැගින් සැකසීම සඳහා රු. මිලියන 3.95 ක් වෙන් කර තිබුණත් එම නිෂ්පාදනයන් සිදුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම ඉලක්ක ඉටුකර නොගැනීම<br>2019වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව ව්‍යාපෘති 11ක් ඉටුකර ගැනීමට සැලසුම් කර තිබුණි .එසේ වුවත් සැලසුම් කරන ලද ඇතැම් ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි වීම නිසා ඉලක්ක කරා ගමන් කිරීමට නොහැකි විය. එමෙන්ම ක්‍රියාත්මක වූ ඇතැම් ව්‍යාපෘති වලින් අපේක්ෂිත ආදායම් කරා ලඟා වීමට නොහැකි වීම ද ඊට හේතු වී ඇත.<br>මව්පෝෂ, සුවපෝෂ ව්‍යාපෘතින් යන්ත්‍ර සූත්‍ර කැඩී තිබීම නිසා සිදු කිරීමට නොහැකි විය. එමෙන්ම දේශීය සහල් ව්‍යාපෘතියෙන් ලද ආදායම අඩුවීම, දේශීය බීම ව්‍යාපෘති (BFN) ආදායම අඩුවීම, සහල් සබලකරණ ව්‍යාපෘතියේ ප්‍රතිපාදන අඩුවෙන් ලැබීම,දෙහිවල අලෙවිසැලේ ආදායම අඩුවීම බලපා ඇත. එමෙන්ම නාරාහේන්පිට පැළ අලෙවිසැල ඉදිරිපස මාර්ගය පුළුල් කිරීම නිසා පිටුපස ස්ථානයකට අලෙවිසැල ගෙනයාමට සිදු වීම නිසා පාරිභෝගික ආකර්ශණය අඩුවීම මත ආදායම් අඩු වී ඇත. මෙකී හේතු මත 2019වර්ෂයේ ඉලක්ක ගත ආදායම අඩු වී ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මකකළ යුතුය. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව බුත්තල ගොවිපලෙහි කොම්පෝස්ට් පොහොර හා බඳුන් මිශ්‍රණ කිලෝ ග්‍රෑම් 300,000 බැගින් සැකසීමට සැලසුම් කර තිබුණත් කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 129,115 ක් (සියයට 43) හා බඳුන් මිශ්‍රණ කිලෝ ග්‍රෑම් 119,000 ක් (සියයට 40) පමණක් නිෂ්පාදනය කර තිබුණි. පොහොර ව්‍යාපෘතියේ ශුද්ධ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 48 කින් අඩු වී තිබුණි. | බුත්තල නිෂ්පාදනය කරන කොම්පෝස්ට් සහ බඳුන් මිශ්‍රණ අලෙවි කරනු ලබන්නේ මණ්ඩලයට අයත් නාරාහේන්පිට සහ දෙහිවල පැළ අලෙවිසැල් මඟිනි. එහෙත් 2019මැයි මාසයෙන් පසු කිරිමණ්ඩල මාවත පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමඟ නාරාහේන්පිට පැළ අලෙවිසැලේ අලෙවි කටයුතු අඩාල වී ආදායම අඩුවිය. බුත්තල ගොවිපලේ වැඩිම නිෂ්පාදන ප්‍රමාණයක් අලෙවි කරනු ලබන්නේ නාරාහේන්පිට පැළ අලෙවිසැල තුළය. පැළ අලෙවිසැලට උදාවූ මෙම තත්වයක් සමඟ බුත්තල නිෂ්පාදන කටයුතු සීමා කිරීමට සිදුවිය. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඌන භාවිත පලතුරු බීම නිෂ්පාදන ව්‍යාපෘතියේ 2019 වර්ෂය සඳහා පලතුරු බීම බෝතල් 25,000 ක් නිෂ්පාදනයට සැලසුම් කර තිබුණද, ඉන් සියයට 12 ක පමණක් නිෂ්පාදනය කර තිබුණු අතර සෝයා ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා පසුගිය ආසන්නතමවර්ෂ 03 ක් ඇතුළත රු. මිලියන 2.8 ක් වැයකර තිබුණද අවසන් නිෂ්පාදනය පාරිභෝගිකයා වෙතමණ්ඩලය විසින් ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා ඌන භාවිත පලතුරු යොදා සාදන බීම බෝතල් 25,000ක් සෑදීමට සැලසුම් කර තිබුණද මෙම ඌන භාවිත පළතුරු අස්වැන්න ලැබෙන්නේසෘතුමය බැවින් පළතුරු සොයා ගැනීමේ අපහසුතාවය නිසා ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂා කළ පරිදි පළතුරු බීම නිෂ්පාදනය කිරීමට නොහැකි විය. ඉදිරියේදි මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ලික සහයෝගිතාවය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |